# ලංසු ආරාධනයයි

## ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

### ගලගම සංචාරක ගිමන්හල වසර 3ක් සඳහා බදු දීම

වර්ෂ 2026.03.01 දින සිට 2029.02.28 දින දක්වා වසර 03 (තුන) ක කාලයකට බදු දීම සඳහා පහත උපලේඛනයේ විස්තර කරනු ලබන ගලගම සංචාරක ගිමන්හල වෙනුවෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 2026.02.20 වන දින පෙ.ව. 10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සඳහා කාර්යාල වේලාවන් තුළ දුරකථන අංක 045-2287361 ඇමතීමෙන් හෝ https://www.imbulpe.ps.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ගලගම සංචාරක ගිමන්හල පරිශ්‍රය පරීක්ෂා කිරීමට ඇති හැකියාව**

ටෙන්ඩර් අයදුම් කරන අපේක්ෂිතයන් හට 2026.02.06 දින සිට 2026.02.19 දින දක්වා සතියේ වැඩකරන දින වල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති/ලේකම්ගේ අනුමැතිය සහිතව පරීක්ෂා කළ හැකිය.

**ටෙන්ඩර්පත් නිකුත් කිරීම**

2026.02.06 දින සිට 2026.02.19 දින දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ටෙන්ඩර්පත් ඉඹුල්පේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී නිකුත් කරනු ලැබේ.

**ටෙන්ඩර්පත් භාර ගැනීම**

2026.02.20 දින පෙ.ව. 10.00 දක්වා ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ. සම්පූර්ණ කරන ලද ඔබගේ ටෙන්ඩර් අයදුම්පත් ***"සභාපති, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව,මොරහැල,බලන්ගොඩ"*** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීමෙන් හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ ඉදිරිපත් කිරීම කළ හැකිය.

**ටෙන්ඩර්පත් විවෘත කිරීම**

2026.02.20 වන දින පෙ.ව. 10.00 ට ටෙන්ඩර්පත් ඉඹුල්පේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කිරීමේ අවස්ථාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ ඔහුගේ ලිඛිත බලයලත් නියෝජිතයකුට හෝ සහභාගී විය හැකිය.

**උපලේඛනය**

| අනු අංකය | ටෙන්ඩර්පත් කැඳවනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය | බදු කාලය | ආපසු නොගෙවනු ලබන අයදුම්පත්‍ර ගාස්තුව | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැම්පත් මුදල | අවම මාසික ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|---|
| 01 | ගලගම සංචාරක ගිමන්හල | අවුරුදු 03 | රු 1,000.00 | රු 5,000.00 | රු 35,000.00 |

**විශේෂ කොන්දේසි**

- ටෙන්ඩර් අයදුම්පත් ලබා ගැනීමේ දී අයදුම්කරුවන් තමාගේ අනන්‍යතාවය තහවුරු කළ යුතුය.
- විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්වල මුල් පිටපත හා අනු පිටපත් වෙන වෙනම කවරවල බහා කවරයේ වම්පස ඉහළ කෙලවරේ මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර එම කවර දෙකම එකම කවරයක බහා එම කවරයේ වම්පස ඉහළ කෙලවරේ ගලගම සංචාරක ගිමන්හල බදු දීම යනුවෙන් සඳහන් කළ යුතුය.
- අයදුම්පත් ලබා ගැනිමට දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පදිංචිකරුවෙකුට අවස්ථාව පවති.
- තෝරා ගන්නා ලද බදුකරුවන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස හයක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් සභාවට ගෙවිය හැකිය. එම මුදලින් හයෙන් එකක් නොහොත් මසක කුලිය බදුකරු තෝරා ගැනිමෙන් පසු පළමු දින තුළ ගෙවිය යුතුය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි මාස පහෙහි කුලිය එකවර ගෙවා 2026.03.01 දිනවන විට ගිවිසුම් අත්සන් කළ යුතුය.
- මාස හයක කුලි මුදලින් හයෙන් එකක් පළමු දින තුළ ගෙවා ටෙන්ඩරය පිළිගෙන ගිවිසුම් අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් එම මුදල නිදහස් කරනු නොලැබේ
- ලිඛිතව දැන්වූ පසු ටෙන්ඩර්කරු නියමිත දිනට පෙර ගිවිසුම්ගත නොවුනහොත් ඊළඟ ටෙන්ඩර්කරුට ටෙන්ඩරය පිරිනමනු ලැබේ.
- ටෙන්ඩර් ආකෘතිපත් ලබාගෙන ටෙන්ඩර් ඉදිරිපත් නොකරන හා ටෙන්ඩර් පිළිගෙන වහාම තැන්පත් මුදල් ගෙවා ගිවිසුම් අත්සන් කිරීමට අපොහොසත්වන ටෙන්ඩර්කරුවන්ට ස්වකීය ටෙන්ඩර් ඇප මුදල ආපසු ගෙවනු නොලැබේ.
- අවම ටෙන්ඩර් ගාස්තුවට වඩා අඩුවෙන් ලංසු මුදල සඳහන් කර ඇති හා අපහැදිලි අකුරෙන් සම්පූර්ණ කර ඇති ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ටෙන්ඩර් අයදුම්පත්‍රයේ කරනු ලබන සෑම අළුත් කිරීමක්, කපා හැරීමක්, සංශෝධනයක් හෝ වෙනස් කිරීමක් තම කෙටි අත්සන යොදා ටෙන්ඩර්කරු විසින් සහිතික කළ යුතුය.
- ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ ලිඛිතව බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැකිය.
- ටෙන්ඩර් කොන්දේසි,විස්තර සහ ගිවිසුම ටෙන්ඩර් අයදුම්පත්‍රය සමඟ ලබා දෙනු ලැබේ.
- ටෙන්ඩර් පිළිගැනිම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අවසාන තීරණය ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතු වේ.

ජේ.එම්.එස්.ජේ. බණ්ඩාර,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

2026 පෙබරවාරි මස 06 වන දි
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේදිය.